*හැඳින්වීම*

*සෙම්බුකුට්ටිගේ සේනාධීර පියසේන 1922 නොවැම්බර් 14 දින කළුතර දිස්ත්‍රික්කයේ දේවගොඩදී උපත ලබන්නේ එගම වැසි වැවිලිකරුවකු වූ සෙම්බුකුට්ටිගේ ඕදිරිස් සිල්වා සහ කරුණාකලාගේ චලෝ නෝනා යුවලගේ තුන්වැනි දරුවා ලෙසිනි. පියසේන දරුවාට යන්තම් වයස අවුරුදු හතර හමාරක් වෙද්දී මව වියෙ-ර්වීමෙන් පසු සිය අයියාත් අක්කාත් නංගීත් සමඟ ලොකු අම්මාගේ රැකවලේ ඇතිදැඩිවන්නට ඔහුට සිදුවිය. අලුත්ගම ඉංග්‍රීසි පාසලෙන් මූලික අධ්‍යාපනය ලැබූ හෙතෙම ද්විතිය අධ්‍යාපනය සඳහා කොළඹ ආනන්ද විද්‍යාලයට ඇතුළත් කෙරිණි. උසස් අධ්‍යාපනය සඳහා 1939 වසරේදී ඉන්දියාවේ කල්කටා විශ්වවිද්‍යාලයට ඇතුළත් වුවද දෙවන ලෝක යුද්ධය හේතුවෙන් අධ්‍යාපන කටයුතු අතරමග නවත්වා 1941 වසරේදී නැවත සිය රට පැමිණීමට ඔහුට සිදුවිය. පසුව පියාගේ අභාෂය ලැබ ශ්‍රී ලංකාවේ වාමාංශික දේශපාලනයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු බවට පත්වෙමින් එකල කොමියුනිස-'ටවාදීන් විසින් ප්‍රකාශයට පත්කළ 'නව ශක්තිය' නමැති පුවත්පතේ කර්තෘ මෙන්ම ප්‍රකාශකයා බවටද පත්වෙමින් ජනමාධ්‍ය හා සමීප සබඳතාවක් ඇති කරගත්තේය. 1948 දිනමිණ කර්තෘ මණ්ඩලයට මාධ්‍යවේදියෙකු ලෙස එක්වූ පියසේන දෙවසරක සේවා කාලයකින් පසුව 1951 දී ලංකා ගුවන් විදුලි සේවයේ සිංහල අංශයේ නියෝජ්‍ය සංවිධායක ලෙස පත්වීමක් ලැබුවේය. දේශපාලන බලපෑම් හේතුවෙන් ගුවන් විදුලියෙන් ඉවත්ව 1956 දී පාර්ලිමේන්තුවේ කථා පරිවර්තකයෙකු ලෙස රැකියාවක් ලත් හෙතෙම 1966 වසරේ සමස්ථ ඉන්දීය ගුවන් විදුලි සේවයේ සිංහල අංශයේ වැඩසටහන් නිෂ්පාදකයෙකු ලෙස පත්වීමක් ලැබ ඉන්දියාවට පිටත්ව ගියේය. 1976 වසරේ යළි සිය රට පැමිණි පියසේන 'දවස', ලංකාදීප, ලේක්හවුස් ආයතනයෙන් ප්‍රකාශයට පත්කළ පුවත්පත් මෙන්ම ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේද විවිධ තනතුරු දරමින් සේවය කළ අතර කලක් ජනාධිපති ජේ ආර් ජයවර්ධනගේ මාධ්‍ය ලේකම්වරයා ලෙසද අනතුරුව ඉන්දියාවේ ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස්වරයා වශයෙන්ද පත්කරනු ලැබීය. වෘත්තීය ජනමාධ්‍ය ජීවිතයෙන් සමුගෙන 1991 දී ඕස්ට්‍රේලියාවේ පදිංචියට ගියේය. එහිදීද විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය කීපයකටම සිය ශ්‍රම දායකත්වය ලබාදුන් හෙතෙම ජීවිතයේ සැඳෑ සමය ගෙවා දමන්නට තමන් උපන් රටට යළි පැමිණියේ ඉකුත් වසරේදීය.*

*'අන්ධානුකරණයෙන් විනාශය', 'තට්ටු මාරුව පවුල්වාදය හා විනාශය', 'කසාය බීපු ගොලුවෝ', සහ 'රටවල් තුනක මාධ්‍ය සමග දශක හතක්' නමින් දේශපාලනය විෂය කරගත් පොත් හතරක් ලියා පළකොට ඇති පියසේන මහතා ශ්‍රී ලංකාවේ වමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් පුවත්පත්වලට ලියූ ලිපිද ඇතුළත් කොට සම්පාදිත අලුත්ම පොත 'සමසමාජ 75 සහ 2010 මැතිවරණය' නමින් මේ වන විට මුද්‍රණ ද්වාරයේය. වර්ථමානයේ හේ හුදකලාව වෙසෙන හෝමාගම පනාගොඩ රොමියෙල් මාවතේ නිවෙ-සේදී ඔහු හා මේ සාකච්ඡාව පැවැත්වෙන්නේ එම පොත ප්‍රකාශයට පත් කිරීමට සහ ඔහුගේ අසූ අටවැනි ජන්ම දින සමරුවට දින කීපයකට ඉහතදීය. .........*



**ජීවිතේ වැඩි කාලයක් කාර්ය බහුල පුද්ගලයෙකු විදිහට මිනිසුන් අතර ගැවසුන ඔබ අද හුදකලාව මේ විදිහට නිවෙසක තනිවෙලා ඉන්න එක මොන විදිහටද හිතට දැනෙන්නේ ?**

මම අදටත් කැමතියි මිනිස්සු අතරේ ඉන්න. හුදකලා බවට මම කොහොමත් අකමැතියි. ඒත් වයසට යද්දී අනෙක් හැම කෙනෙකුටම වගේ මටත් හුදකලාව උරුම වෙලා තියනවා. ඒක තමයි ස්වාභාවය. දරු-වෝ ළඟ හිටිය කියලත් වෙනසක් නෑ. මම 1991 ඉඳලා ඔස්ට්‍රේලියාවේ පොඩි පුතාගේ ගෙදර හිටියේ. පුතා උදේට වැඩට යනවා. රෑ වෙලා ගෙදර එනකම් ඒත් මම තනියම තමයි ගෙදරට වෙලා හිටියේ. ඒ ඉන්න ගමන් ලියන එක කරගෙන යනවා. දැන් මට ලියන්නත් බෑ. මම කියන කොට වෙන කෙනෙකුට කියලා තමයි ලියන එක කරගන්නේ. ඒත් ලියන එක නවත්තන්න හිතෙන්නේ නෑ. දැන් මම ලියන්නේ ඒ දේවල් ලියලා තියන එකේ අයිතිහාසික වටිනාකම සලකලා.

**සාමාන්‍යයෙන් කලා ක්ෂේත්‍රවල අය වයසට යනකොට, හුදකලා වෙනකොට ආගමික ජීවිතයකට නැඹුරු වෙනවා. ඔබ ?**

මම හිතන්නේ ඔතන තියෙන්නේ හිත හදාගැනීම කියන කාරණය කියලයි. මම දැනට මට පුළුවන් විදිහට, මම දන්න විදිහට යහපත් ජීවිතයක් ගත කරමින් හිතේ සන්තෝෂෙන් ඉන්නවා. බුද්ධ දේශනාවේ තියන මනෝ පුබ්බං ගමා ධම්මා කියන අනුශාසනාව ගරු කරගෙන ඒ විදිහට ජීවත්වෙනවා ඇරුණා කොට අමුතුවෙන් ආගමික ජීවිතයක් කියලා එකක් මට නෑ. අපි හුරුවෙලා තියන ජීවන රටාව එක සැරේම වෙනස් කරලා හාමුදුරුවරු වගේ ජීවත්වෙන්න අපිට බෑ. නමුත් පිංකම් කරනවා. පාලුවට ගිහින් තිබුණා අපේ ගමේ පන්සල මම පහුගිය කාලේ සම්පූර්ණයෙන්ම අලුත් වැඩියා කළා.

**ඔබගේ අලුත්ම පොත මේ වෙනකොට මුද්‍රණ ද්ව-ාරයෙන් පිටවෙලා තියනවා. මේ පොත ගැන හැඳින්වීමක් කළොත්...?**

2009 මම ලංකාවට ආවට පස්සේ සති අන්ත පුවත්පත් දෙකකට ලියුව ලිපි කීපයකුත්, 1962 සිළුමිණ සහ ඔබ්සෝවර් පත්තරවලට ලියුව ලිපි කීපයකුත්, වම මුහුණ පෑව ගැටළු ගැනත් මේ පොතට ඇතුළත් වෙනවා. මම මේ පොතෙන් පෙන්-වන්නට අදහස් කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා වමේ පක්ෂ අතර සමගියට එල්ල වුණ බාධාවන් සහ ඒවා ජය ගැනීමට දැරුණු උත්සාහයන් ගැනයි.

**ඔබේ ළමා කාලය ගතවුණේ කොයි විදිහටද ? ඒ කාලේ හිතුනද කවද හරි දවසක රටේ නමක් තියන පුද්ගලයෙක් වෙයි කියලා ?**

එහෙම හිතුනේ නෑ. මගේ ළමා කාලයත් සාමාන්‍ය ළමයෙක් විදිහට තමයි ගෙවුණේ. අම්මා නැතිවෙන කොට මට අවුරුදු හතර හමාරයි. අක්කට අවුරුදු හයයි. නංගිට අවුරුදු එකහමාරයි. ඒ වෙනකොට තාත්තා එයාගේ සහෝදරයොත් එක්ක පොල්ගහවෙල ඉඩම් වවන එක කළේ. අම්මා තමයි දේවගොඩ මහගෙදරට වෙලා අපිව බලාගෙන හිටියේ. ඒ කාලේ මගේ විනෝදාංශය තමයි ගෙදර වත්තේ රබර් ගස්වලින් වැටෙන ඇට අහුලන එක. එහෙම එකතු කරපු රබර් ඇට කූඩයක් අපේ දේවගොඩ ගෙදර තිබුණා මට මතකයි. අම්ම නැතිවුණාට පස්සේ තාත්තා අපිව අම්මගේ අක්කට බාර දුන්නා. එයා හිටියේ අලුත්ගම. දේවගොඩ මහගෙදරට ආයිබෝවන් කියලා අලුත්ගමට එන දවසේ ඒ රබර් ඇට කූඩයම විසිකරලා දැම්මා. ආශාවෙන් එකතුකරපු රබර් ඇට ඒ විදිහට විසිකරලා දාන කොට මට මහ දුකක් දැනුනා. මගේ අම්මා ගැන, අම්මගේ අවමඟුල ගැන, වගේම රබර් ඇට කූඩේ ගැන අද මට තියෙන්නේ යන්තම් සිහිනයක් වගේ වේදනාබර මතකයක්. මහම්මා අක්කව අලුත්ගම සංඝමිත්තා ඉස්කෝලෙටත් මාව අලුත්ගම ඉංග්‍රීසි ඉස්කෝලෙටත් ඇතුළ් කළා. ටික කාලයක් ඒකෙ ඉගෙන ගන්න කොට තාත්තා මාව කොළඹ ආනන්ද විද්‍යාලයට දාලා හොස්ටල් එකේ නැවැත්තුවා. එතන ඉඳලා පාසල් අධ්‍යාපනය අවසන් වෙනකම්ම මගේ ජීවිතේ ගෙවුණේ ආනන්දයේ පන්ති කාමරයයි හොස්ටල් එකයි අතරේ.

සංවාදය සහ සේයා රූ
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

**තාත්ත ගැන මොන වගේ මතකයක්ද තියෙන්නේ ?**

තාත්තා බොහොම තද හිතක් තිබුණ දැඩි තීරණ ගන්න කෙනෙක්. අම්ම නැති වුණාට පස්සේ ආයෙත් කසාදයක් නොබඳින්න තීරණය කරලා තමයි අපිව මහම්මාට බාර දීලා තියෙන්නේ. දේශපාලන වශයෙන් ගත්තම තාත්තා වාමාංශිකයා. සහෙ-ාදරයෝ එක්ක පොල්ගහවෙල පැත්තෙ ඉඩම් වවන්න ගිහින් හිටපු කාලේ එහෙ ගම්කාර්ය සභාවේ සාමාජිකයෙක් විදිහටත්, උප සභාපති විදිහටත් තේරිලා ඉඳලා තියනවා. ඒ කාලේ පොල්ගහවෙල, අලව්ව, පොතුහැර කියන ප්‍රදේශ තුනම එකම ගම් කාර්ය සභාවක් විදිහටයි තිබිලා තියෙන්නේ.

මට ඉන්දියාවේ ඉගෙන ගන්න ලැබුනේ තාත්තගේ යාලුවෙක් නිසා. ඉස්කෝලේ නිවාඩුවට තාත්ත මාව පොල්ගහවෙල වත්තට එක්කගෙන යනවා. වැඩි හරියක්ම ඒ ගමන යන්නේ කොටපිටිය පාරෙන්. ඒ පාරේ හිටිය ශිරෝමණී ඔබේසේකර කියන වෛද්‍යවරයාගේ ගෙදරට මාත් එක්කම ගොඩවෙන එක තාත්තගේ පුරුද්දක් වගේ වෙලා තිබුණා. මාව ඉන්දියාවට යවලා උගන්වන්න කියලා තාත්තට කිව්වේ මේ වෛද්‍යවරයා. ආචාර්ය ගණනාත් ඔබේසේකර, වසන්ත ඔබේසේකර දෙන්න මේ වෛද්‍යවරයගේ දරුවෝ. මගේ හිතුවක්කාර විවාහයට තාත්තා බොහොම තදින් විරුද්ධ වුණා. ඒ වුණාට විවාහයෙන් පස්සේ මාස් පතා රුපියල් පනහක් මට යවන්න කියලා තාත්තා රබර් විකුණන කඩේට කියලා තිබුණා. මගේ නමට ඉඩම් අක්කර 15 ක් තාත්තා ලියලා තිබුණ බව මම දැනගත්තේ හුගාක් කාලෙකට පස්සේ.

**ඔබේ වැඩිහිටි ජීවිතයේ දීර්ඝ කාල වකවානුවක ගෙවෙන්නේ මාධ්‍යත් එක්ක. අද බොහෝ දෙනෙක් ඔබ හැඳින්වීමට යොදන්නෙත් 'ප්‍රවීණ මාධ්‍යවේදී' කියන වචන යුගල. කොහොමද ඔබ මාධ්‍යයට අත්පොත් තියන්නේ ?**

ආනන්දයේ ඉගෙන ගන්න කාලේ තමයි මට මුලින්ම සඟරාවක් සංස්කරණය කරන්න ලැබෙන්නේ. ආනන්දයේ නේවාසික ශිෂ්‍යයන්ගේ නිවාසය 'අශෝක'. මේ නිවාසේ ළමයි එකතුවෙලා 'ද අශෝකියන්' කියලා සඟරාවක් පටන්ගත්තා. ඒකේ සිංහල කොටස සංස්කරණය කරන්න පැවරුණේ මට. ඒ වෙනකොට අපිට සිංහල භාෂාව ඉගැන්නුවේ ටිබෙට් ජාතික එස් මහින්ද හාමුදුරුවෝ. භාෂාව ගැන හොඳ දැනුමක් මහින්ද හාමුදුරුවන්ගෙන් අපිට ලැබුණා. පාසලෙන් අස්වෙලා වැඩිදුර අධ්‍යාපනයට ඉන්දියාවේ ගිහිල්ලා ආවට පස්සේ ඒ කාලේ කොමියුනිස්ට්වාදීන් ආරම්භ කරලා තිබුණ 'නව ශක්තිය' පත්තරේ කරන්න මට පැවරුණා. ටික කාලයක් මේක කරගෙන යනකොට විවාහය නිසා මට දේශපාලන වැඩවලින් ඉවත්වෙන්න වුණා. එහෙම ඉන්න අතරේ තමයි ලේක්හවුස් එකට සම්බන්ධ වෙන්න ලැබුණේ. හතලිස් අටේ මම දිනමිණ පත්තරේ මාධ්‍යවේදියෙක් විදිහට රස්සාවට ගියේ රුපියල් 180/-ක මාස් පඩියකට. ඒ විදිහට තමයි ඒ ගමන එන්නේ.

**ඔබ වැඩිපුරම සේවය කරලා තියෙන්නේ රාජ්‍ය මාධ්‍ය ක්ෂේත්‍රයේ. කොහොමද ඒ කාලේ රාජ්‍ය මාධ්‍ය. අද වගේම දේශපාලනය විසින් හසුරවන තත්ත්වයක්ද තිබුණේ ?**

අද වගේ නැතත් ඒ කාලෙත් දේශපාලන බලපෑම්වලට යටත්ව තමයි අපිට කටයුතු කරන්න වෙලා තිබුණේ. 1951 පෙබරවාරි 26 වෙනිදා මම ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයේ සිංහල අංශයේ නියෝජ්‍ය සංවිධායකවරයා විදිහට අලුතින් පත්වීමක් ලැබිලා, ලේක්හවුස් එකෙන් අස්වෙලා ගිහින් වැඩ බාරගත්තා. එතන වැඩකරගෙන යන අතරේ දවසක් බූස්සේ අමරසිරි කියලා හාමුදරුනමක් ඇවිල්ලා ඉල්ලීමක් කළා රාජගිරියේ ඔබේසේකරපුර අමර විහාරය කියලා අලුතෙන් හැදුව පන්සලක පන්සිය නමකගේ පිරිත් දේශනාවකුයි පහුවදා දහක් නමකගේ දානෙකුයි තියනවාය ඒකේ විස්තර සජීවීව ගුවන් විදුලියෙන් විකාශය කරන්නය කියලා. ප්‍රධාන ආරාධිතයා අගමැති ඩී. එස්. සේනා-නායක කියලත් අපිට දැනුම් දුන්නා. සිංහල අංශයේ සංවිධායක තේවිස් ගුරුගේයි, ප්‍රධාන ඉංජිනේරුවයි, මමයි ගණන් හදලා බැලුවම මේකට විශාල වියදමක් යනවා. පස්සේ මම හාමුදරුවන්ට ලිපියකින් දන්වලා යැව්වා මේකට විශාල වියදමක් යනවා ඒ වගේම මේ වගේ දෙයක් නරක පූර්වා දර්ශයක් වෙනවා ඒ නිසා මේ වැඩේ කරන්න බෑ කියලා. හාමුදුරුවෝ මේ ලිවුම අරගෙන අගමැති ඩී. එස්. ට පෙන්වලා මේක කරලා දෙන්න කියලා තියනවා. ඩී. එස්. හයියෙන් හිනාවෙලා 'අපිට පිංකම් කරන්න රේඩියෝ මොකටද හාමුදුරුවෙ-න්. හාමුදරුවෝ පිරිත් කියන්න. අපි දානේ දෙන්නම්' කියලා කියලා තියනවා. මේකෙන් පහුබහින්නේ නැතුව හාමුදරුවෝ ඊළඟට ගියා ගුවන් විදුලිය බාර ඇමැති සිත්තම්පලම් මුණගැහෙන්න. මිනිහා හොඳ හින්දු බැතිමතෙක්. අවස්ථාවෙන් ප්‍රයෝජන අරගෙන බෞද්ධයන් අතරේ ජනප්‍රිය වෙන්න මේක හොඳ අවස්ථාවක් බව තේරුම් ගත්ත සිත්තම්පලම් හාමුදරු-වන්ට කිව්වා මේක ගුවන් විදුලියෙන් සජීවීව දෙනවා විතරක් නෙවෙයි මම පිංකමට සහභාගිවෙන්නත් එනවා කියලා. පැය දෙකක් ඇතුළත ගුවන් විදුලියේ අධ්‍යක්ෂ ජෙනරාල් ලැම්සන්ට ඇමැතිගෙන් නිල නියෝගයක් ලැබුණා මේ පිංකම සජීවීව විකාශය කරන්න කියලා. මේක කරන්න බෑ කියලා ලිවුම යැව්වේ මමනේ. ඒ නිසා ආත්ම ගෞරවය රැකගෙන මම ගුවන් විදුලියෙන් අස්වීමේ ලිපිය දීලා එතනින් එළියට ආවා. ඔය කියන පංසලේ තමයි බණ්ඩාරනායක ඝාතනයේ පළවෙනි විත්තිකාරයා තල්දූවේ සෝමාරාම නැවතිලා ඉඳලා තියෙන්නේ. අවුරුදු ගානකට පස්සේ තමයි ඒක දැනගන්න ලැබුණේ.

**මාධ්‍යවේදියෙකු විදිහට ගතකළ කාලය තුළ ඔබ ආශ්වාදයෙන් කටයුතු කළේ කොයි කාලෙද ? කවර මාධ්‍යයක් සමඟද ?**

මගේ ජීවිතේ දීර්ඝම සේවා කාලයත්, සන්තෝෂයෙන් වැඩකරන්න ලැබුණ කාලයත් ඉන්දියාවේ සමස්ථ ඉන්දීය ගුවන් විදුලියේ වැඩකරපු කාලය තමයි. හැටහයේ ජනවාරි තුන්වෙනිදා මම ආකාශ්වානි ගුවන් විදුලියේ සිංහල වැඩසටහන් නිෂ්පාදනයට නවදිල්ලියට ආවා. ලංකාවේ ආගමික නායකයන්, දේශපාලන නායකයන් ඉන්දියාවට ආවම ඒ අය එක්ක කරන සම්මුඛ සාකච්ඡා වැඩසටහන්, බෞද්ධ වැඩසටහන් තමයි වැඩියෙන්ම කළේ. කිසිම ගැටළුවක් නැතුව